**<u>ලංසු ආරාධනයයි</u>**

**<u>සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ඌව පළාත</u>**

**<u>උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන දැන්වීමයි.</u>**

ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා පහත සඳහන් උපකරණ ප්‍රවාහනය කර සැපයීම සඳහා ජාතික තරඟකාරීත්ව ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ ලංසු කැඳවනු ලැබේ.

| කාණ්ඩ අංකය | අ.අ | අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු(රු.) | ආපසු නොගෙවන ගාස්තුව(රු.) |
|---|---|---|---|---|---|
| | | | | බැංකු සුරක්ෂණ හෝ මුදලින් | |
| 01 | 01 | Desktop Computers(i3) | 25 | 100,000.00 | 3,500.00 |
| | 02 | Laptop Computers(i3) | 01 | | |
| | 03 | Printers | 07 | | |
| | 04 | UPS | 31 | | |
| | 05 | Monitors | 03 | | |
| | 06 | Mini Color Printers | 01 | | |
| | 07 | Digital Multimedia Projector | 03 | | |
| | 08 | Photocopy Machine | 01 | | |
| | 09 | Dot-Matrix Printer | 01 | | |
| 02 | 01 | ලිපිකරු මේස(මෙලමයින්) | 08 | 60,000.00 | 3,500.00 |
| | 02 | ලිපිකරු පුටු | 20 | | |
| | 03 | ලිපිගොණු අල්මාරි | 09 | | |
| | 04 | ලාච්චු සහිත ලිපිගොණු කබඩ් (4 Drawers) | 07 | | |
| | 05 | පරිගණක මේස | 09 | | |
| | 06 | ඇඳි සහිත පුටු | 16 | | |
| | 07 | විධායක මේස | 03 | | |
| | 08 | විධායක පුටු | 02 | | |
| | 09 | පරිගණක පුටු | 08 | | |
| | 10 | වීදුරු වානේ අල්මාරි | 02 | | |
| | 11 | ලිපිගොණු රාක්ක | 03 | | |
| | 12 | ඇඳි රහිත ප්ලාස්ටික් පුටු | 73 | | |
| | 13 | ඇඳි සහිත ප්ලාස්ටික් පුටු | 06 | | |

01.මේ සඳහා උනන්දුවක් දක්වන,සුදුසුකම් ලත් ලංසුකරුවන්/නියෝජිතයින් හෝ නම් කළ නියෝජිතයින් සඳහා 2026.08.19 දින සිට 2026.09.02 දින දක්වා රාජකාරි දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලිඛිත අයදුම්පතක් හා එක් එක් බාණ්ඩ වලට අදාලව ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව ලංසුපත් ලබාගත හැකිය.අවශ්‍ය සුදුසුකම් ලංසු ලේඛනයේ සඳහන් කර ඇති අතර ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පැමිණ අදාල ලේඛන නොමිලේ පරික්ෂා කර බැලිය හැක.

02. අනු පිටපතකින් යුක්තව සම්පූර්ණ කරන ලද ලංසු "මුල් පිටපත"හා "අනු පිටපත " යනුවෙන් සලකුණු කර වෙන් වෙන්ව කවර දෙකක බහා මුද්‍රා තබා ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **<u>"උපකරණ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම"</u>** යනුවෙන් සඳහන් කර ඔබගේ මිල ගණන් 2026.09.03 දින ප.ව.1.30 හෝ ඊට පෙර ලැබෙන සේ **<u>සභාපති,ප්‍රසම්පාදන කමිටුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, දයා ගුණසේකර මාවත, බදුල්ල</u>** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ඉහත ලිපිනයේ ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ලබා දිය හැක,ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03.ඉදිරිපත් කරනු ලබන ලංසු ලේඛන 2026 නොවැම්බර් 20 වන දින දක්වා වලංගු විය යුතුය.

04.ඉහත ඒ ඒ කාණ්ඩ සඳහා ලංසු සුරක්ෂණයන්(Bid Bonds) ලංසු ලිපි ලේඛන වල දක්වා ඇති ආකෘතියට අනුකූලව පළාත් අධ්‍යක්ෂ(ඌව),සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නමට ඉදිරිපත් කළ යුතු අතර එය 2026 දෙසැම්බර් 18 වන දින දක්වා වලංගු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති රාජ්‍ය/වාණිජ බැංකුවකින් ලබා ගත් ලංසු සුරක්ෂණයක් විය යුතුය.

05.පූර්ව ලංසු රැස්වීමක්,ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේ දී 2026.08.25 දින ප.ව 2.00ට පැවැත්වේ.

06. 2026.09.03 වෙනි දින ප.ව 2.00ට ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරයේ දී ලංසුපත් විවෘත කිරිමට නියමිත අතර,ඒ සඳහා ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

07. කවර හෝ ලංසුවක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරිමේ පූර්ණ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(DPC) සතු වන අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

07.ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරන අතර, ප්‍රසම්පාදන කමිටු තීරණය අවසාන තීරණය වනු ඇත.

08.මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ඌව පළාත් සත්ව නිෂ්පාදන හා දෙපාර්තමේන්තුවෙන් කාර්යාල වේලාව තුල දී ලබාගත හැකිය. දුරකථන අංක 055-2222698

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව(ඌව),**
**දයා ගුණසේකර මාවත,**
**බදුල්ල.**